## උඩුබද්දාව ප්‍රාදේශීය සභාව

## කුරුණෑගල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 29 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 සැප්තැම්බර් 16 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට උඩුබද්දාව ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.1,195,722 ක් සහ 2012 වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම් රු.1,118,878 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ආ). 2010 වර්ෂය සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු සඳහා වෙන්කිරීම් කර නොතිබූ අතර ඒ වෙනුවෙන් 2012 වර්ෂයේ ලද රු.7,000,000 ක වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කිරීම මත සමාලෝචිත වර්ෂයට අදාල මුද්දර ගාස්තු ආදායම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.39,641,942 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.28,102,341 ක් ලෙස දැක්වීම මත ස්ථාවර වත්කම් වල වටිනාකම රු.11,539,601 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ). සමාලෝචිත වර්ෂය තුල ඉටුකල කර්මාන්ත 07 ක් වෙනුවෙන් වූ රු.2,427,998 කර්මාන්ත ණයගැති යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.2,139,510 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.16,956,735 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,167,089 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 768 | 831 | 481 |
| (ii) | බදුකුලී | 9,575 | 7,253 | 102 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 763 | 1,112 | - |
| (iv) | වෙනත් ආදායම් | 42,616 | 38,248 | 67 |

2.2.2 වරිපනම් බදු

සමාලෝචිත වර්ෂයට අදාලව වරිපනම් බදු බිල්කිරීම රු.750,000 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟය රු.194,197 ක් විය. එතුල වාරික 08 වඩා හිඟ වරිපනම් ඒකක 36 යටතේ රු.88,326 ක් පැවතුණි.

2.2.3 බදුකුලී

සමාලෝචිත වර්ෂයට අදාලව අවම ලංසුව රු.687,635 ක් වූ දේපල 12 ක් බදුදී තිබූ අතර තුන් වරක් ටෙන්ඩර් කලද අවම ලංසුව රු.1,587,048 ක් වූ දේපල 17 ක් බදුදීමට නොහැකිව තිබුණි.

2.2.4 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 02 ක් ස්ථාපිත කර තිබූ අතර එකී කුළුණු වෙනුවෙන් රු.20,000 ක පෙරසැරි ගාස්තුවක් පමණක් අයකර තිබුණද ඒ වෙනුවෙන් ව්‍යාපාර බදු හෝ වෙළඳ බලපත්‍ර ගාස්තු අයකිරීම කෙරෙහි සභාවේ අවධානය යොමුව නොතිබුණි.

2.2.5 <u>වාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශය තුල වාහන නැවැත්වීමට අදාල අතරු ව්‍යවස්ථාවට අනුව ත්‍රීරෝද රථයක් නැවැත්වීමට වාර්ෂිකව රු.250 ක ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් අයකර තිබූ අතර 2011 වර්ෂය වන විට ත්‍රීරෝද රථ නැවතුම් පලවල් 4 ක් යටතේ ත්‍රීරෝද රථ 65 ක් පමණ ලියාපදිංචි කර වාර්ෂිකව රු.16,250 ක පමණ ආදායමක් උපයා තිබුණත් සමාලෝචිත වර්ෂය අවසානයට එම ආදායම රු.3,000 ක් දක්වා අඩුවී තිබුණි.

2.3 <u>අවිධිමත් ගනුදෙනු</u>

(අ). වයඹ පළාත් පාලන කොමසාරිස් ගේ 2012 ජුලි 25 දිනැති අංක: GGRC/21/30 දරන ලිපිය ප්‍රකාරව වියට්නාම විදේශ සංචාරය සඳහා අනයම් දීමනා ලෙස ඇ.එ.ජ.ඩොලර් 30 ක් මුදල ලබාගත හැකි ලෙස දක්වා තිබුණද අදාල විධිවිධාන වලට පටහැනිව, සභාපතිවරයා හා ලේකම්වරයා විසින් රු.217,131 ක් වැඩිපුර ලබාගෙන තිබුණි.

(ආ). 2009 ජූනි 15 දින සභාවේ සභාපති හා ලේකම් සමග කිරි නිපදවන්නන්ගේ සමූපකාර සමිතියේ සභාපති හා ලේකම් අත්සන් කරන ලද ගිවිසුම පරිදි සභාවේ වැලිපැන්නගහමුල්ල පුස්තකාලය පිහිටි ඉඩමේ කොටසක අඩි 25x20 ප්‍රමාණයේ ගොඩනැගිල්ලක් සාදා ගැනීමට එකී සමිතියට අවසර දී තිබුණි. මේ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්වරයා දැනුවත් කර නොතිබුණි.

2.4 <u>වත්කම් කළමනාකරණය</u>

(අ). සභාව සතු වත්කම් පිළිබඳ 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන ) රීති මාලාවේ 218 රීතිය ප්‍රකාරව සමීක්ෂණයන් සිදුකර වත්කම් වල අයිතිය හා පැවැත්ම තහවුරු කර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. ගම්සභා වලට අයත් ඉඩම් ප්‍රාදේශීය සභා පිහිටුවීමත් සමඟ අදාල ප්‍රාදේශීය සභා වෙත පවරා දී තිබූ අතර මෙම සභාව අදාල ඉඩම් පවරා ගැනීම සඳහා මෙතෙක් කටයුතු කර නොතිබුණි. ඒ හේතුවෙන් සභාවට අයත් යැයි සැලකෙන තුංතොට ප්‍රදේශයේ ඉඩමක අනවසර ඉදිකිරීම් පවතින අතර ඒ පිළිබඳ සොයා බලා කටයුතු කර ද නොතිබුණි.

(ආ). වටිනාකම රු.226,320 ක් වූ මත්ස්‍ය අලෙවි කුටි 6 ක් 2010 වර්ෂයේ දී සියයට 50 සහනාධාර යටතේ රු.113,160 කට ධීවර අමාත්‍යාංශයෙන් (වයඹ) ප්‍රාදේශීය සභාව විසින් ලබාගෙන තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසන් වන විට එයින් මාළු කුටි 4 ක් නිශ්කාර්යව කැන්දයාය අපද්‍රව්‍ය භූමියේ තබා තිබුණි.

2.5. වාහන උපයෝජනය

(අ). ආසියානු සංවර්ධන ණය ආධාර යටතේ 2007 වර්ෂයේ රු.5,250,000 කට සභාව විසින් මිලදී ගත් RS - 1220 අංක දරණ JCB යන්ත්‍රය භාවිතය පිළිබඳ මාසික පිරිවැය වාර්තා සකස්කර නොතිබුණි.

(ආ). 2012 වර්ෂය තුල JCB යන්ත්‍රය සඳහා රු.330,976 ක ඉන්ධන ලීටර් 2875 ක් භාවිතව තිබුණු අතර යන්ත්‍රය වෙනුවෙන් මාසික පිරිවැය වාර්තා සකස් කර නොතිබු අතර ඒ වෙනුවට ධාවන සටහන් සකස් කර තිබුණි.

2.6 මානව සම්පත් කළමනාකරණය

සභාවේ ස්ථිර මාර්ග කම්කරුවන් 13 දෙනෙකු හා ස්ථිර සෞඛ්‍ය කම්කරුවන් 06 දෙනෙකු හා දෛනික පදනම යටතේ සෞඛ්‍ය කම්කරුවන් 03 දෙනෙකු වූ අතර ඔවුන් දිනපතා රාජකාරි වල යෙදවීම සම්බන්ධයෙන් ඉදිරි වැඩසටහනක් පවත්වා නොතිබුණි. දිනපතා පවරනු ලබන රාජකාරි මත ඔවුන් සේවයේ යොදවා තිබූ අතර ඒ පිළිබඳව කම්කරුවන් සේවයේ යෙදවීම පිළිබඳව දෛනික වාර්තාව නමින් පත්‍රිකාවක් නඩත්තු කර තිබුණි. එහි යෙදවූ කම්කරුවන් සංඛ්‍යාව පමණක් දක්වා තිබූ අතර නිශ්චිතව අදාල කාර්ය සඳහා යෙදවූ කම්කරුවන්ගේ නම් ඇතුලත් කර නොතිබුණි. නිශ්චිත දිනක පැමිණි කම්කරුවන් බෙදාහැර ඇති ආකාරය පැහැදිලිව හඳුනාගත හැකි ලේඛණයක් හෝ ආකෘතියක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ). දුම්මලසූරිය පොදු වෙළඳපලේ අංක 01 කඩ කාමරය අනවසර බදුදීම පිළිබඳ 2012 අප්‍රේල් මස සභාවට වාර්තා වී තිබුණ ද අනවසර අතුරු බදුකරු අදාල කඩය කරගෙන යන බව තහවුරු වන අතර අදාල කඩය මුද්‍රා තබා සභාවට පවරා ගැනීමට 1980 අංක 46 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ විධිවිධාන පරිදි සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) වටිනාකම රු.48,841 ක් වූ හිඟ බදුකුලී අයකර ගැනීම සඳහා කුලියාපිටිය මහේස්ත්‍රාත් අධිකරණයේ පැවරූ නඩු 02 කට අදාලව එකී නඩු තීන්දු ප්‍රකාරව මුදල් ගෙවන ලෙස තීන්දු වී ඇතත් එකී මුදල් සභාව වෙත ලැබී ඇති බවක් හඳුනාගත නොහැකි විය. නඩු ලේඛනයේ නඩු තීන්දු දිනය සටහන් කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වත්කම් කළමනාකරණය

(ඉ) වාහන උපයෝජනය